# අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## III ශ්‍රේණියේ කම්කරු, මුරකරු, සංචාරක බංගලා භාරකරු තනතුරු

## (PL-1 වැටුප් පරිමාණය) සඳහා බඳවා ගැනීම

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ III ශ්‍රේණියේ කම්කරු, මුරකරු, සංචාරක බංගලා භාරකරු තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය :-**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින්, අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, පුරප්පාඩු සංඛ්‍යාව අනුව, බඳවාගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම් :-**

(i) **අධ්‍යාපන සුදුසුකම් :-**
අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය.

**(ii). වෘත්තීය සුදුසුකම් :-**
අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තිය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**(iii). පළපුරුද්ද :-**
අදාල ක්ෂේත්‍රයේ ලබාඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**(iv). කායික සුදුසුකම් :-**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**(v). වෙනත් :-**

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය
- අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.
- පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක පහත දක්වා ඇත.

**පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක**

| කම්කරු | මුරකරු | සංචාරක බංගලා භාරකරු |
|---|---|---|
| මහනුවර | මහනුවර | නුවරඑළිය |
| මාතලේ | මාතලේ | මාතර |
| මාතර | නුවරඑළිය | |
| ගම්පහ | කෑගල්ල | |
| කුරුණෑගල | කොළඹ | |
| කළුතර | ගාල්ල | |
| රත්නපුරය | කුරුණෑගල | |
| හම්බන්තොට | ගම්පහ | |
| බදුල්ල | කළුතර | |
| කොළඹ | | |

**03.** **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-**

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය.

(iii) මෙම පත්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 සහ 2009.02.20 දින දරණ අති විශේෂ ගැසට්පත්‍රයේ පළකරන ලද රාජ්‍ය සේවා සංශෝධන කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත් වේ.

**04.** **වයස් සීමාව:-**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

මේ සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් පමණි.

**05.** **වැටුප් පරිමාණය** :- මෙම තනතුරට රු.11730-10x120-10x130-10x145-12x160-17600/- මාසික වැටුප් පරිමාණයක් හිමිය.

**06.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| | | |
|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 02. | වෘත්තීය සුදුසුකම් | 30 |
| 03. | පළපුරුද්ද | 35 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 |
| | **මුළු ලකුණු** | 100 |

සටහන :-

(i) සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සුදුසුකම් ලත් අයදුම්කරුවන් පමණි.

(ii) සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

**07.** **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

**08.** (අ). අයදුම්පත් 2013.11.15 දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"අධ්‍යක්ෂ ජනරාල්,
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, නුවර පාර,
ගැටඹේ,
පේරාදෙණිය"

(ආ). ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක **01** සිට **04** දක්වාත්, **02** වන පිටුව අංක **05 -10** දක්වාත්, පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

(ඇ). අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ***"අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 111 ශ්‍රේණියේ කම්කරු /මුරකරු/ සංචාරක බංගලා භාරකරු තනතුරට බඳවා ගැනීම"*** යනුවෙන් තමා අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

(ඇ). එක් අයදුම්පතක් ඉදිරිපත් කළ යුත්තේ එක් තනතුරක් සඳහා පමණි. ඔබ විසින් එක් තනතුරකට වැඩි ගණනකට අයදුම්කරන්නේ නම්. ඒ එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

(ඉ). අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. **22,935/-** කට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන, රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

(ඊ). දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්, තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(උ). මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**09.** **සාවද්‍ය තොරතුරු සැපයීම :-**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි සහගත බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත්, ඊට අදාල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

# ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## III කම්කරු/ මුරකරු/ සංචාරක බංගලා භාරකරු තනතුර සඳහා බඳවා ගැනීම

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ☐ සිංහල - 2 දෙමළ - 3 ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (I). මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :- ..........
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
උදාහරණ :- SILVA , G.A

(ii). මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :- ..........

(iii). සම්පූර්ණ නම :- ..........

02. (I). පෞද්ගලික ලිපිනය :- ..........

(ii). කැඳවීම් ලිපිය එවිය යුතු ලිපිනය :- ..........

03. (I). ස්ත්‍රී / පුරුෂ භාවය :- ☐ පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(ii). ජන වර්ගය :- ☐ සිංහල - 1 දෙමළ - 2 ඉන්දියානු දෙමළ - 3
මුස්ලිම් - 4 වෙනත් - 5

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(iii). ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐

(iv). දිස්ත්‍රික්කය :- ..........

(v). මැතිවරණ කොට්ඨාශය :- ..........

04. (i). උපන්දිනය :- ☐☐☐☐ ☐☐ ☐☐
වර්ෂය මාසය දිනය

(iii) 2013.06.......... දිනට වයස ☐☐☐☐ ☐☐ ☐☐
අ
අවුරුදු මාස දින

(iii) විවාහක/අවිවාහක බව :- ☐ අවිවාහක - 1 ☐ විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

**05.** (i). **අධ්‍යාපන සුදුසුකම්**

**අ.පො.ස. (සා.පෙළ)**

| වර්ෂය | විෂයය | සාමාර්ථය | වර්ෂය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(ii). වෙනත් :-

(iii). ඉහත අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න.

**06.** **රැකියාවට අදාල වෙනත් සුදුසුකම් :-**

**07.** **පළපුරුද්ද :-**

**08.** **අයදුම්කරුගේ සහතිකය :-**

(අ). මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කර සිටිමි.

(ආ). මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත්, මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

........................................................................
අයදුම්කරුගේ අත්සන

දිනය :- ........................................................................

09. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මම පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ ඇය 2013........................................ මස ........................................ දින මා ඉදිරිපිට දී ඉහත අත්සන තබන ලද බවත් සහතික කරමි.

........................................................................
සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :- ........................................................................

තනතුර :- ........................................................................
ලිපිනය :- ........................................................................
දිනය :- ........................................................................

10. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-** ( දැනටමත් සේවයේ යෙදී සිටින අපේක්ෂකයින් සඳහා)

අයදුම්කරු/ අයදුම්කාරිය ඉහතින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, නිවැරදි බවත් ඔහුගේ/ ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් මෙම තනතුර සඳහා තෝරාගත හොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

........................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

තනතුර :- ........................................................................
දිනය :- ........................................................................